# ගල්ඔය හන්දියට පිවිසෙමු

**සඳුන් ජයවර්ධන**

ම විසින් තතු කීමට යෙදෙන මෙම ගල්ඔය හන්දිය පිළිබඳව මුල් හැඳින්වීමක් අයෙකුට අවැසි විය හැකිය. එසේ නොමැති නම් ඇතැම් විට ම විසින් විස්තර කෙරෙන මේ ගල්ඔය හන්දිය ඩී. එස්. සේනානායක මහතාගේ ගල්ඔය ජනපද ව්‍යාපාරය හා පටලැවෙනු ඇති. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව ගල්ඔය හන්දියෙහි පූර්වතම නම් පටබැඳින්නාවේ. "ගල්ඔය හන්දිය" යන ස්ථාන නාමය මේ සොඳුරු වන පෙතට යෙදීමේත්, මේ වන පියස ජනපදයක් බවට පෙරැළීමේත් මුල් බුහුමන දුම්රිය දෙපාර්තමේන්තුවට නිතැතින් හිමිය.

දුම්රිය මගින් කොළඹ සිට ගල්ඔය හන්දියට දුර සැතපුම් එකසිය හතලියකි. මහව සන්ධියෙන් හැරී ඍජුව දිවෙන නැගෙනහිර දුම්රිය මාර්ගයෙහි එකසිය සතලිස් වෙනි සැතපුම් කණුවට මඳක් නුදුරින් සුන්දර කුඹුක් වනපෙතකට පිටුපා ගල්ඔය හන්දිය දුම්රිය ස්ථානය පිහිටා ඇත්තේය. දුම්රථ මාර්ගය ඍජුව මඩකලපුවටද වම් ඇලයට හැරී ත්‍රිකුණාමලයටද දිවෙන්නේය. මේ සුප්‍රකට දුම්රිය මංසන්දිය "ගල්ඔය හන්දිය" යැයි නම් ලබා ඇත්තේය. ගමෙහි දිවිගෙවෙන බහුතරය දුම්රිය දෙපාර්තමේන්තුවේත් එහි අනුපූරක ආයතන වලත් සේවය කරන්නෝය, නැතහොත් ඔවුන්ගේ අනුප්‍රාප්තිකයෝය.

ජනපදයක් වශයෙන් පමණක් නොව අද අපගේ නෙත් සිත් යොමු කෙරෙවෙන වෙසෙස් පරිසර ලකුණු බොහෝමයක් ගල්ඔය හන්දියෙහි ඇතිවන්නේ 1957 වසරේ ඇතිවූ මහා ගංවතුරෙන් අනතුරුවය. මේ ගංවතුර මට්ටම අද පවා දුම්රිය පොළෙහි ලකුණු කොට ඇත්තේය. 1957 වසරෙන් මෙපිට ඉදිවුණු වාරි නිර්මාණ ගල්ඔය හන්දියෙහි පරිසර පද්ධතියේ සුවිශේෂිතා රැසක් සලකුණු කොට තිබේ. ගමට සමාන්තරව නැගෙනහිරින් ඇඳෙන මහ ඇල යැයි ගැමියන් ගෙන් නම් ලද ගල්ඔය ඇලද ගම් පියසට උතුරෙන් මින්නේරිය හතරැස් කොටුව මාගීයෙන් දෙකට බෙදා වෙන් කෙරෙන කුඩා වැවද මේ (වාරි මාර්ග සිතියම්හි දැක්වෙන්නේ මින්නේරි වැවේ සිට කවුඩුල්ල හා කන්තලේ වැව් දක්වා ජලය ගෙන යන ඇල මාගීය ලෙසිනි.) ඇතිවන්නේ 1957 පසුව ඉදි කෙරෙන වාරි නිර්මාණ වල ප්‍රතිඵලයක් ලෙසිනි. මේ ජලාශ පද්ධතිය ගල්ඔය හන්දියෙහි ජන ජීවිතයටත්, ඒ ජන දිවිය හා නිබඳ බැඳී පවත්නා වන දිවියටත්, නිසැකව අපගේ නෙත් සිත් මුලින්ම යොමු කරනා කුරුළු දිවියටත් මහත් පිටුවහලක්ව පවතී. අවසන් වරට තතු කී කුඩා වැවේ වැඩි කොටස දැන්, මෑතකදී නම් කෙරුණු කව්ඩුල්ල ජාතික වනෝද්‍යාන රක්ෂිතයට අයත්ව පවතින්නේය.

මීට අමතරව සිසිල් දියෙන් සුසැදි කාංගි ඇලද සුන්දර බොරළු ඇලද මිනිස් අතකින් උදව් නොලැබූ සොබා නිර්මාණයෝය. මෝසම් වර්ෂාවෙන් පණ ලබන මොවුහු වසරෙහි මාස කීපයකට පමණක් පෙනී සිට වියළි කලාපීය දැඩි හිරු රැසට අවනතව වසරේ වැඩි කලක් සැඟව සිටින්නෝය.

ගල්ඔය හන්දියෙහි ස්වාභාවික අගයන් ගැන මෙනෙහි කිරීමේදී නිතැතින් මුල්තැන ගන්නෝ වන සතුන්ය. සුප්‍රකට වන මායිම් කීපයකට මැදිව පැවතීමද දැඩි නියගයට පවා නොසිඳෙන ජල සම්පත්ද කරන කොටගෙන ගල්ඔය හන්දිය වන සතුන්ගේ නිරන්තර ආගමනයට නතුව පවතී. සිව් පා උරගාදීන්ට අමතරව සියවගීයක සියොත්හුද ගල්ඔය හන්දිය අවට වන පෙතෙහි පහස ලබති. තවත් බොහෝ ගණනක පක්ෂීහු අවට දිය මං කරා නිහැරෙති.



Madhubhashini Jayawardena

කිසිඳු ආයාසයකින් තොරව ගල්ඔය හන්දියෙහි මහ වනය හා ලඳු කැලෑද සිය මංද සිහි කරවන සත්ව කොට්ඨාශ තුනකි. පඳුරු හා වැටුනු පරඬැලින් පෝෂිත වියළි ලඳු කැලෑ සර්පයින්ගේ සැකමුසු ගමන සිහිකරවන්නේය. දැවැන්ත රුක් ගොමු හා සිසිල ගෙනෙන හුදෙකලා වනස්පතීන් සිහි කැඳවන්නේ හස්තීන්ය. රුක් මුඳුන්ද දස ලක්ෂ ගණනක කුඩා මසුන්ගෙන් සුසැදි දිය මංද කුරුළු දිවියට කැපව පවතී. බොහෝ අයගේ නොකැමැත්ත හා පිළිකුලට බඳුන් වූ සර්ප ගණයා හා නිතොර ගම්මුන් හා සටනට එළඹෙන හස්තීන්ද අතැර අගති රහිත නිදහස් කාමී කුරුල්ලන් දෙසට අපගේ අවධානය යොමු කරමු.

ඔබ කුරුළු ලෝලියකු නම් ගල්ඔය හන්දියෙහිදී ඔබට අත්විඳිය හැකි දෑ අන් කිසිඳු දෙයකට දෙවැනි නොවේ. උදෑසන පළමු හිරුරැස තුරුමුඳුන් සිපගනිත්ම, කුරුල්ලන් සිය ගණනකගේ කූජනය ඔබ පිනවනු ඇත. සියළුම වර්ගවල ප්‍රීණියෝ (Prinias) බොහෝය. ළය කායුරු වී කුරුල්ලන් හා නිතඹ සුදු වී කුරුල්ලන් සිය ගණනික් ඔබේ හිසට පියඹා යන්නේ තටු වලින් ශබ්ද නඟමිනි. ඔවුන් ලඟ ලඟම ඇති තණබිම් කරා පියඹා යන්නවුන් විය යුතුය. බැම සුඳු පවන් පෙන්දා කිසිඳු චකිතයකින් තොරව ඔබ අසලින්ම රැඟුම් රඟනු ඇත. ආසියානු රැහැන් මාරා, ටිකල් නිල් මැසි මාරා, මෙහි සුළඹය. සියළු වර්ග වල සබ්රිත්තෝ සහ සැරිටිත්තෝද මෙහි හැසිරෙති. මියුරු කූජනය නිසා සිත් අදවන කළු හිස් කොවුල් සැරටිත්තාටද ඔබට සවන් දිය හැක. ඔබ සංචාරය කරනුයේ ඔක්තෝම්බර්, අප්‍රේල් අතර තුර කාලයේ නම් නිසැක ලෙසම අව්ච්චියාට සවන්දී ඌ දැක බලා ගැනීමට ඔබට හැකිවනු ඇති. මදක් සවන් දී බලන්න. සියළු කූජන අභිබවා ගායනයෙහි යෙදෙන සුප්‍රකට කුරුළු ගායකයා, වන පොල්කිච්චා ගේ නාදය ඔබට නොවරදවාම ඇසෙනු ඇති.

දැන් දිනය උණුසුම්ය. ඔබ සූදානම් වන්නේ පාතරාසය ගෙන හුදෙකලාව සැරිසරන කුරුල්ලන් කවුරුදැයි විමසා බැලීමටය. ඔබේ ගමන් මඟ වැටී ඇත්තේ දුම්රිය මඟින් ඔබ්බෙහි සමබිමෙහි පිහිටි සිසිල දනවන කුඹුක් වන පෙත මැදිනි. මෙහි කිසිඳු අයුරකින් ශුෂ්ක කලාපීය අපහසුවක් ඇති නොවේ. හාත්පස පිහිටා ඇත්තේ කුඹුක් වනයය. තුරුමුඳුන් වල රිලා හා වඳුරු ගණයා බොහෝය. දැන් උදෑසන කූජනය මැකී ගොසිනි. ඔබ වන පෙත මැදින් ඇවිදින පරඬැල් පෑගෙන හඬ හැරුණු විට සියළු දේ ඒකාත්මික


Upul Wikramasinghe


Upul Wikramasinghe

නිහඬතාවයේ ගිලීපවතී නැත, අපට ඇසෙන්නේ නිහඬතාවය ඈතින් බිඳෙන හඩකි. වලිකුකුළෙකු සිය වසම පිළිබඳ නිවේදනය ප්‍රතිමල්ලවයකුට ඉදිරිපත් කරයි. කුඹුක් වන තීරුවට හා ගල්ඔය ඇලට අතර බිම් තීරය ගම්වාසීන්ගේ ගෙවතු කීපයකින්ද සැඳුම් ලද්දේ වේ. වියළි කලාපීය තුරුලතා මෙහි සුලභය. උස් තුරු මුදුන් මෙන්ම මධ්‍යම ප්‍රමාණයේ ශාක පන්තීන්ගෙන් සැඳුම් ලද්දේ වේ. මධ්‍යම ප්‍රමාණයේ උසකින් පියාසරනා විමසුම්කාරී නිල්මුහුණැති මල්කොහා ඔබට මෙහිදී බලාගත හැකිය. තැන්වැති ශ්‍රී ලංකා අළු කෑදැත්තා ද නොවරිදින සාමාජිකයෙකි. තුරු මුඳුන්ත සිට තවත් තුරු මුදුනකට පාවී එන විෂ්මය ජනක හොටකින් යුතු පෝරු කෑදැත්තා ද සුළබය. මේ ගෙවතු තීරය පසුකරමින් ඔබ සෙමින් ඇවිද යන්නේ නුස් පඳුරු සහිත මිටියාවතකිනි, නොයෙක් වර්ගයේ පතොක් හා වර්ණවත් මලින් ගැවසී ගත් ලන්තානා පඳුරින්ද නියඟලා ආදී නොයෙක් පුෂ්පයන්ගෙන් සුසැදි වැල් වලින්ද සේවිත මේ මිටියාවත, අවසන් වන්නේ ගල්ඔය ඇල ඉවුරෙනි.

නියං සමයේ ගල්ඔය ඇලෙහි ජලය ගලා යෑමත් දක්නට නොහැකිය. වැලිතලයෙන් බාධක වූ ඇතැම් තැනක පමණක් ජලය ගලායන රිදී නඳට සවන් දිය හැකිය. ඇලෙහි දෙඉවුරු දැවැන්ත කුඹුක් ගසින් සෙවන ලබන්නේය. මේ තුරු මුඳුන් බෙහොමයක් දඩයමින් යැපෙන ජලාශ්‍රිත උකුස්සන්ගේ වාසස්ථාන වන්නේය. රජ අළු හිස් මසුකුස්සා හා තේජවන්ත කුසඇලි සයුරුකුස්සාද මෙහි දඩයමින්  යැපෙති. දියෙහි පාවෙන මත්ස්‍ය කුණුපයන්ගෙන් යැපෙන බමුණු පියනකුස්සා ඉතා සුළභය. කළු ඉසැසි මැඩි පිළිහුඩුවා හා නිල් කන් පිළිහුඩුවා හැරුණු විට අනෙකුත් පිළිහුඩුවන් මෙහිදී පෙරොත්තු විය හැකියි. අති දුර්ලභ පෙරදිගු රන් පිළිහුඩුවා පවා මෙහි දිවිගෙවන්නේය. වරෙක දුර්ලභ නිහැරියෙකු වන ජේත්තුකාර තඹලපිය කොණ්ඩකොහාද මේ ලියුම්කරු විසින් මෙහිදී දැක ඇත්තේය.

ඇල මාගීය නිතර වැටෙන කුඹුක් පත්‍රයන්ගෙන් වැසී ඇත්තේය. පිළිහුඩු හා උකුසු ගණයාට ආහාර පිණිස කුඩමස්සු දශලක්ෂ ගණනක් ඇලෙහි දිවි ගෙවති. නියං සමයෙ අග ඇලමඟෙහි ඉහළ ඉතිරි වනුයේ ගලාබසිනි දියමඟක් නොව නොගැඹුරු දියකඩති කිහිපයකි. නියං සමයෙහි අවසානයට පෙර දිය කඩති තුළ සිරවන කුඩමස්සු පක්ෂීන්ට පමණක් නොව හුදෙකලාව සැරිසරන සිවල් ආදී සතුන්ටද ආහාර පිණිස දිවි පුදති. මෝසම් වැසි ඇරඹීමට මසකට පමණ පෙර මසුන්ගෙන් මුළුමනින්ම තොර වන මේ දිය වලවල් වල මීලඟ අනුප්‍රාප්තිකයා වනුයේ අනර්ථකාරී මැලේරියා මදුරුවාය. මෝසමට පෙර සිය පියාසැරිය අරඹන ඇනෝෆිල්ස් මඳුරු කීටයන් ලක්ෂ කීපයකට මේ දියකඩිති තිඹිරි ගෙය වන්නේය. එසේ වුවද ගල්ඔය හන්දියෙහි අසිරිය නරඹන ඔබට ඒ ගමනට පෙර ඔබ ගන්නා ඖෂධ මාත්‍රාවෙන් මැලේරියාවෙන් මුළුමනින්ම දුරුවී සිටිය හැකිය.

දැන් අවට වාතය උණුසුම්ය. තුරුමුඳුන් වල කෙලිදෙලෙන් ගත කරන රිලවුන් හා වඳුරන් හැරුණු විට සියල්ල නිහඬය. වියළි කලාපයට ආවේණික ගූඪ බවෙන් යුතුය. ඔබ මෙහි පැමිණියේ, හුදකලාව නම් මද චකිතයක් පවා ඇති කරවන තරමට මේ ඇල දෙපස ගුප්තය. එසේ වතුදු මේ සුන්දර බිම් තීරුව පිළිබඳව ඔබගේ මතකය සදා අමරණීය වන්නේය. මක්නිසාද යත් මේ බිම් කඩ වියළි කලාපයේ දුර්ලභ නිමැවුමක් වන බැවිනි.

පීඩාකාරී දාහයකින් අනතුරුව නිසල සවස්යාමය එළඹෙන්නේය. වැව් තීරයේ සුන්දරතම හෝරාව දැන් උදාවේ. මේ කුඩා වැව් කීපය නැතහොත් මින්නේරි, කන්තලේ ඇලමාගීය දහස් ගණනක ජලචර පක්ෂීන්ගේ නවාතැන් පල වන්නේය. ඔබ පිරිසේ සිටින්නේ උපරිම වශයෙන් සිව්දෙනෙකු පමණක් නම් නිසි ආරක්ෂාකාරී උපාංග සහිතව ඔරුවකින් වැව තරණය කිරීම වඩා ප්‍රතිඵලදායකය. සියළුම වර්ගවල දියකාවුන්, තිත්හොට පැස්තුඩුවන් මෙහි සියගණනින් සැරිසරති.

වැව මැඳ පිහිටි කුඩා දූපත් කීපය සියළුම වර්ගවල කොකුන්ගේ ලැගුම් පොළවල්ය. නිහැරි තාරාවුන්ද, වල් තාරාවුන්ද සුළබය. සවස්යාමයේ දිරාගිය ගසක අතුපතර දඩයම් සොයා සිය අත්භූත කහපැහැති දෙඇස් වෙහෙස වන බොරකෙවුල් බකමූණාද දැකිය හැකිය. ගල්ඔය හන්දියෙහි හා කවුඩුල්ල ජාතික වන උයනෙහි කුරුළු දිවියෙන් ඉතා පෙහොසත් පෙදෙස මෙයයි. කුරුළු නරඹන්නෙකු තෘප්තිමත් කෙරෙන දේ මෙහි වුවමනාතරම් ඇත්තේය.

අඳුර පැතිරෙත්ම ඔබ ආ මඟින් හෝ විකල්ප මගකින් ඔබේ නවාතැන් පොළ කරා පැමිණිය යුතු වන්නේය. එය කඳවුරු භූමියක් නම් වඩා යහපත්ය. නමුඳු කඳවුරු ඉදිකිරීමේදී රාත්‍රියෙහි ඔබ මොබ යන හස්තීන්ගෙන් ඈත්ව කඳවුරු ඉදිකිරීමට වග බලාගත යුතුය.

දැන් ඔබ සිටිනුයේ ලංකාවේ ඔබ කිසිදිනක නුදුටු සොඳුරු බිම් කඩක් හා එහි ජීවත්වන සත්ව සංහතිය ගැන ලැබූ නැවුම් අත්දැකීම් මෙනෙහි කරමිනි. ඔබ කඳවුරු බිමෙහි ගිණිමැලයකි. පැහැදිලි අහසෙහි තාරකා සියක් කෝටියකි. මෑතින් ඇසෙන ඉන්දු බිම් බස්සාගේ පළිගු බිම දමන්නාක් වැනි සුමිහිරි නාදය ඔබ සිටින්නේ ලංකාවේ වියළි කලාපයේ බව ඔබට සිහිකර දෙයි. බිම් බස්සාගේ සුමිහිරි හඬට සවන් දෙමින් ඔබ ගැඹුරු සුවදායී නින්දකට පිවිසෙනු ඇති. නමුඳු එය මැදියමකට මඳකට පෙර හෝ තම හඬ නිසා යක්කුරුල්ලා යැයි අපකීර්තියට පත් උකුසු බකමූණාගේ බියකරු හඬ ඔබට බාධා නොකොළොත් පමණි.

කුරුළු නම් වැල මහදුරු සරත් කොටගමයන්ගේ
“සිරිලක කුරුල්ලෝ” ග්‍රන්ථය අනුව යෙදිනි.